
# නිර්මාණ Nirmana



## සතුට

උණුසුම ලබා මව් උකුලේ නැලැ වෙද්දී
මොලකැටි මුවින් මවගේ කිරි උරවද්දී
සෙනෙහස් ගඟුල දෙහදෙම උතුරා යද්දී
රජවෙයි සතුට මව හා පුතු සැන සෙද්දී

ළමයින් සමග එක්වී සිටි සම වයසේ
සෙල්ලම් කරනවිට දුව පනිමින් රිසිසේ
නොදැනෙයි බරක් ජීවිතයේ කිසිම ලෙසේ
එබැවින් සතුට පවතී දරුවන් මනසේ

විදුහල් මව වෙතින් සිප් සත ලබන විට
මිතුරන් සමග තරහෙට එහි දුවන විට
දෙගුරුන් ගුරුන් පිනවා ජය ලබන විට
ඉතිරෙයි සිසුන් හද තුළ ජනිතවූ සතුට

පැදගෙන යද්දි තව දුර දිවි ගංගා වේ
සුමිහිරි හැඟුම් පිරි යව්වන විය ළං වේ
හද පුබුදන කෙනෙකු ඒ අතරේදි හමු වේ
ඉන්පසු සතුට ඔවුනගෙ දිවියට යොම වේ

යුග දිවි සරු කරන් දරුවන් සමග පෙමින්
දියුණට ඔවුන්ගේ දිව රෑ වෙහෙස වෙමින්
ජය ටැඹ කරා යන බව උන් වෙර දරමින්
ළං වෙයි සතුට මා පිය සිත් තුළට පෙමින්

මේ ලෙස ළඟාවන දිවියට කලින් කල
මා හැඟි ධනය සතුටයි කළ නොහැකි මිළ
ඒ මුත් තනිව ගත සවි බල නොමැති කල
සෝ දුක් මිස සතුට නම් නොරැඳෙයි අසල

♦ විශ්‍රාමික විදුහල්පතිනි
ප්‍රේමා අදිකාරි
Morden Surrey UK

## කන්දේ විහාරය

ගාලු පුරේ සිට යෙත අගනුවර දෙස
බෙන්තර පාලම ද මුහුද ද ගැසෙයි ඇස
අළුත්ගමද පසුකර යන සඳ විගස
කන්දේ වෙහෙර වෙයි කලුමෝදරෙහි හිස

ලන්දේ තොටේ පිටිසර වැසි දන පැමිණ
දන්දේ නිතර බාර ද හාර ද වෙමින
නින්දේ පවා දෙවියන් සිහිනෙන් පෙනෙන
කන්දේ විහාරය වැඳ යෙති බැති සිතින

බැද්ද අසළ පිහිටා ඇති මේ අරණේ
බුද්ධ රක්ෂිතය හිමි බටුවන් හේනේ
ලද්ද දෙයින් තුටුපහටුව වැඩ වසනේ
ඇද්ද මෙවන් හිමිවරු තව ලක් දෙරණේ

නිජ බිම හිමි සඳුගෙ වෙයි බටුවන් හේන
රජ දහනක් වගෙයි බැබලෙන හඳ පාන
කුජ සනි ගහ දොසින් නොකරම අව මාන
වැජ ඹෙති විහිදුවා කිතුගොස අස මාන

දකුණු දෙස පසිඳු ගම් පියසෙක උපත
ලැබුණු පරිදි ගරු පරපුරකින් පැවත
එන බව සැම ජනයා කියතිය සතත
පෙර වාසනාවකි හිමි මෙදෙසට සැපත

අනුහස් තිබෙන තෙද බල දෙවි වැඩ වසන
සුවිසෙස් පුද බිම්මෙකි මෙය අප රට තිබෙන
දෙනුවස් බාර බිළිඳුන් වෙනුවෙන් කෙරුණ
පසලොස්වකට කෙම්මුර දින එති නෙදන

බාර හාර ඉටුකෙරුමට වෙණු දෙවිඳු
වැඩ වසනා දෙවොල මෙය වෙයි ලක පසිඳු
සැම දෙසකින් පැමිණි ජනයා පෙර පුරුදු
අනුගමනය කරති එම සිරිතද දැනුදු

♦ මිල්ලනියේ, ඩී. එස්. වනිගසූරිය
මීගහතැන්න
Sri Lanka

## තොටියෙකුගේ ගීතය

ගඟ දිය උතුරා තොටුපළ පාළුයි
සැඬෑ අඳුර බොර දිය කළඹනවා
උණ පඳුරේ පෙර දා රැඳි සුවඳින්
මියගිය සිහිනය යළි පිබිදෙනවා

පෙරුම්පුරා ඇගෙ වත දැකගන්නට
දිය මංකඩ පාළුව වැතිරෙනවා
දිවි ගැල පදවන්නට මට දිරි දුන්
ඔරු කඳ රහසේ සුසුම් හෙලනවා

ඇගෙ සිත හඳුනා නෙතුයුග සැලුනා
බත්පත සපුරා කුසගිනි සිඳුණා
එගොඩ මෙගොඩ යා වූ පාලම් වැට
මගෙ ලය ගිනි කඳ දැක සැනහේදෝ

♦ සන්ධ්‍යානි සේනාරත්න
London SW15

## කළුතර සෑ රද!

සෑ රද දිලෙන විට කිරි පැහැ රැසින් තෙද
නැහැවේ සිරින් දෙව් මිණි බල එළිය වැද
දුටු දුටු නෙතට මුදු සිසිලක් ගෙනෙන සඳ
මුදුනත් තබා නමදිමි බැති සිතින් සොඳ

යන්තම් පිපී එන නෙළුමක සුද අතුරා
සුදු ගතිගුණ පෙළින් මෙත් සැනසුම පතුරා
මෙත්සර නදින් ගාථා මුව මුව මතුරා
යනවිට හදින් ගැලුවයි සැනසුම උතුරා

සිලි සිලි ගී පොකුරු සවනත රැඳෙන විට
තාලෙට බෝ ළපළු රඟදෙන අයුරු දුට
දැල්වෙන පහන් නුවණෑස හෙළි කරන විට
අඳුරේ මුලා නොවෙනා බව පෙනුණි මට

මොක් සුව සලසමින් නිල් දිය රැළිති නැගේ
සුවයක් ගලයි ඉහළට යට මළුව දිගේ
පවුරක් විලස මහ සෑ රදු රකිනු වගේ
කලු ගං කොමළිගේ පින්බර රෑගුම අගේ

මෙත් සුව රැඳුණු ගතිගුණ මුතු හරක්මය
මහමෙර දුගිනි නිවනා දිය විලක්මය
රන් රැස් විදාලන දෙව් මිණි කඳක්මය
කළුතර සෑ රජිඳු දැයටම සෙතක්මය

♦ දුලාංජලී සිරිවර්ධන
නීති පීඨය කොළඹ විශ්වවිද්‍යාලය

## මගේ දියණියට

මැණිකක් ලෙසට නුඹ නිවසේ දිලෙන කොට
කුසුමක් පරිදි සුවඳින් පිරි පිපෙන කොට
පහනක් සදිසි අප ගෙදරම එළිය කොට
සම්පත එකම නුඹ වේ මේ ලොවේ මට

වසර තුනයි මා නුඹගෙන් දුරස් වෙලා
නෙත් අග කඳුළු බිඳුවකි නුඹ මතක් වෙලා
ගතින් ඇතත් නුඹ මාගෙන් ඈත් වෙලා
සිතින් ඉන්නෙ නිති නුඹ මට තුරුළු වෙලා

දුරු රටකට ආවෙ මා නුඹ තනි කරලා
සාදන්නටයි නුඹෙ හෙට දින සරු කරලා
එන්නනෙමි ඉක්මනට නුඹ දැක ගන්න බලා
හොඳ දරුවෙක් වෙයන් දුව ගුණදම් රැකලා

පොත පත වැඩ එපා අතපසු කර ලන්න
ඉගෙනුම කෙරෙහි කවදත් මුල් තැන දෙන්න
හැමවිට දුවේ නුඹෙ හොඳ නම රැක ගන්න
දෙවියන් සිටී නුඹහට රැකවල් දෙන්න

♦ ඈන් ප්‍රියාංගනී
Nicosia Cyprus

## මිනිපිරියේ නුඹ මා ළඟ හින්දා .........!

කඳුලින් තව කඳුලක් බිහිවන්නේ
නුඹ මා තුරුළට ආ හින්දයි
සුසිනිඳු රේඛා සුමට අත්ල මත
නිමැවුනෙ ආදර බස් තෙපලන්නයි

ග්‍රහ මණ්ඩලගැන නොසිතපු හෙටගැන
කියා දෙන්න මට හැකි නොවුනත්
රත්තරනේ මගෙ ලොකු මිනිපිරියේ
කෙලෙසක මං නුඹ මගහැර යන්නේ



මා දියණිය නුඹ මා අත එල්ලී
පාසැල වෙත කැන්දාගෙන යද්දී
දුටුවෙමි විහඟුන් කූඩු හැර දමා
එක්වනු බොඳ මීදුම් පටලේ

සම්පයේ නිති දැවටුණු දියණිය
හදවත තුළ රැන්දූ මුදු සැනසුම
දිවියේ මට හිමි විඩාව නිව්වා
මිනිපිරියේ නුඹ මා ළඟ හින්දා

♦ අමර ගුණාස්කර Paris France

## අම්මා

බඩගිනි වී අඬනා විට
කිරි ටික ටික මට පෙව්වා
වැටි වැටි මා දුවනා විට
බත් පිඩ පිඩ මට කැව්වා
පාර පුරා සරනා විට
සකසුරුවම මා සෙව්වා
මා පාඩම් කරනා විට
ළඟට වෙලා නිදි මැරුවා

හිස කෙස් තෙල් අතගාලා
කොණ්ඩ කරල් දෙක ගෙතුවා
සුදු ගවුමේ රැළි හදලා
මා හරියට හැඩ කෙරුවා
අහුමුළු වල සැඟවූ කාසි
මා වෙනුවෙන් දිය කෙරුවා
ඉහළ නගින්නට කියලා
ඉණිමඟ මට ළං කෙරුවා

ශිල්ප සතර, සූප සතර
අඩු නැතුවම මට පෙව්වා
ගත සිත පිරිසිදු කරගෙන
ජීවත්වෙන්නට කිව්වා
හොඳ ගුණදම් ගැන කියලා
ජීවිතයම හැඩ කෙරුවා
ඔබෙ පිළිරුව මගෙ ගත තුළ
මතුවෙන හැටි ඔබ දුටුවා

පෝරුව මත මා සිටියදි
තුටු කඳුලැලි ඔබ හෙලුවා
අපෙ දරුවන් දැඩි කරන්න
අප වාගෙම වෙර දැරුවා
කළ මෙහෙවර ගැන සිතමින්
සැනසුම් සුසුමක් හෙලුවා
අස්ථිර ලොව ස්ථිර වූ
මව් සෙනෙහස මට පිදුවා

♦ කුමාරි විජේරත්න
Hounslow Middx UK

## අත්වැල

පරසතු නොපිපෙන මගෙ ජීවිතයට ඔබ කුසුමක් වූයේ
ගෙවෙන මිලින වන ලොවට අළුත් ජීවිතයක් ඔබ වූයේ
මට නැති දිරියක් හිතට ශක්තියක් ඔබ තුළ මා දුටුවේ
සිත්පිත් නැති ලොව පිළිසරණක් සේ ඔබ මට හමු වූවේ
ආදරයක් නොලැබූ ගැහැණියකට ආදරයම වූයේ

♦ සපුමලී විජේසුන්දර Ilford Essex

## අත්තම්මාගේ සම්පත

නොයෙක් විදියෙ තරු අහසේ බැබ ලෙනවා
තව තරු කැලක් ගැන මා දැන් පව සනවා
මුණුබුරු පිරිස මා ළඟ නිති ගැව සෙනවා
ඒ සුරතල් ලොවේ මා රැජිණක් වෙනවා

මුණුබුරු මිනිබිරියො ඒ අට දෙනාම
කියනා මිහිරි බස් සවනට වේය අම
සුකොමල ඔවුන් ගයනා ගී ඇසු වාම
සක්විති මාලිගය මැවෙනව හද තුළම

ඉගෙනීමෙන් උසස් පල ගෙන ආවාම
දෙගුරුන්ටත් වැඩිය ආඩම්බරයි මම
තෙරුවන් පිහිට පතමින් නොවරද වාම
ආසිරි ඉසිමි මම ඔවුනට හැම දාම

දරු සිව් දෙනාගේ මුනුබුරු මිනි බිරියෝ
උණුසුම දිදී මගෙ ජීවය හැඩ කෙරුවෝ
උන් සම්පතකි යහගුණයට හිමි කරුවෝ
වියතුන් සබා මැද දැන් දිදුලන දරුවෝ

♦ රත්නාවලී කුමාරි දිසානායක
Hounslow Middx UK

## සසර දුක

සසර මග දුකක් වග
දැන දැනම කුමන පල
හමුවෙනා අතර මග
ගිමන්හල නැවතිලා

තරණකර හැකි විගස
නිවන්පුර සොයනු මිස
පලක් නැත අතර මග
තැන් තැන්හි ලතවෙලා

ගිමන්හල ඇල්මෙකී
ඇල්ම බන්ධනයකී
බන්ධනය සසර මග
නිම නොවන කරුමෙකී

♦ නිරංජලා
මනෝහාරි
Nicosia, Cyprus

## පන්සිල්

නොමැරී සිටීමට පණ ඇති සැවොම වෙත
මිනිසට සතුනට ද අයිතිය එකම වෙත
අවිහිංසාව බුදු දහමෙයි මුලට එත
පණ ඇති කෙනෙක් කිසිවිට නොම නැසිය යුත

ලොව පිලිකුල් කරයි සොරකම් කරන කෙනා
නම්බුව උසස්කම පහතට වැටෙයි සැනා
පෙර කුසලයෙන් දිනු මුත් මිනිසෙකු ලෙසිනා
යළි ඔහු සසර මග නෙක් දුකටම වැටෙනා

කම් සුව වැරදි පැවතුම අනාචාරය
ගෙන යන ජීවිතය නිරයටම පාරය
එබැවින් මිදී ඉන් රැක සදාචාරය
සිත හික්මවනු ලැබ බුදු දහම් සාරය

දන සම්පතින් සුබවිහරණ පතන සිත
බොරු බස් බිණුම් වංචාවට නිමිති වෙත
රවටන මුසාවෙන් කිසිවෙකු ගතිය කැත
නිරයට යන පවකි එය අත්හරිනු යුත

සුරා මතින් පසුවන සිත විකල් වුණ
උතුම් මිනිස් ගති ගුණ කෙලෙසයි නිතින
මිදී සුරා පානෙන් ගුණ දම් වඩන
එයයි සැපත පන්සිල් රැක්මෙන් ලබන

♦ කරුණා බස්නායක
Hampstead - London



## ප්‍රතිරූප

සබඳ මට සමුදෙන්න
ගිම්හලෙන් නික්මෙන්න
ඉතින් සිත ඉඩදෙන්න
වරක් නෙත සිපගන්න

දුරින් සිට නොපෙනෙන්න
ඈතොත් ඔබ දැකගන්න
ඈහැක් වෙයි සතුටින්න
ජීවිතේ විඳගන්න

මල් විසුල මග මෙන්න
මතින් ඔබ ඇවිදින්න
රළු පොළව ඉවසන්න
මා දෙපා පිළිගන්න!

♦ ශ්‍රියා කුමාරසිංහ
Dunedin
New Zealand

## මා දයාබර පොඩි අක්කේ ......!

අහෝ ! ඔබ මියගිය බව
කණ වැකුණු මොහොතෙ මට
සහෝදර ප්‍රේමයේ කඳුළු කැට
ගලා වැටුණා තෙමා දොකොපුල්

සුන්දර යුවතියක වූ ඔබ
කැප කළා යෞවනය
බැලමෙහෙවරට
බාලයින් වියතුන් කරනට
පාසැල් දිවියේ සමරු පිටු
එකනෙක ඉරා දමමින්

ප්‍රථම පෙම බිඳ දා
කීකරු දියණියක ලෙස
විවාවිය, මවක් විය දෙදරුවනට
හිමිගේ අකල් වියොවින්
දිරිය මවක සේ දෙදරුන්
වියතුන් කළෙහි සබයට

අනේ එනමුදු ඇයි?
පාළු නිවසක හුදකලාවම
කිසිවෙකුට නොකියාම
ජීවිතය හැරගියේ

කැළඹුවද සිතුවිලි මා
තනිවමයි උපදින්නෙත්
මියෙන්නෙත් එසේමැයි
සිතා සැනසෙමි
දුරු රටක සිට මම්

♦ සුමනා සත්කුමාර
North Hills
California USA

## පාඨක ඔබට

ලංකාවිත්තියෙහි පළකිරීමට එවන කවි හෝ ලිපි ආදී සැම දෙයටම ඔබේ නම හා ලිපිනය හරිහැටි ලියා එවන්න. නිර්ණාමිකව හෝ නම් කැලි සමග හෝ නිකම්ම ලන්ඩන් කියා හෝ එවන කිසිවක් පළවන්නේ නැති බව සලකන්න. - **කර්තෘ**